AL API ( PAPERS GROUP )

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08

# Devi Balika Vidyalaya – Colombo 08

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) - තෙවන වාර විභාගය 2025 සැප්තැම්බර්
General Certificate of Education (Advanced Level) -Third Term Test September 2025

ජීව විද්‍යාව I
Biology I

09 S I

පැය දෙකයි
Two Hours

නම/ විභාග අංකය : ... ..........................................................................

ශ්‍රේණිය
Grade

උපදෙස් :
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ අදාළ නිවැරදි අංකය මත (x) යොදා දක්වන්න.

01. ජෛව සංවිධානයේ ධූරාවලි මට්ටම් අනුපිළිවෙල අනුව ජීවයේ මූලික ව්‍යුහමය ඒකකයට වහාම ඉහළින් හා පහළින් ඇති මට්ටම් පිළිවෙලින්

1) ඉන්ද්‍රියිකා, පටක
2) අණු, ඉන්ද්‍රියිකා
3) පටක, ඉන්ද්‍රියිකා
4) ඉන්ද්‍රිය, ඉන්ද්‍රියිකා
5) ඉන්ද්‍රියිකා, අණු

02. ප්‍රධාන පොලිසැකරයිඩ කිහිපයක් සහ ඒවායේ තැනුම් ඒකක පහත දක්වේ.

| පොලිසැකරයිඩය | තැනුම් ඒකකය |
|---|---|
| A ඉනියුලින් | P ගැලැක්ටියුරොනික් අම්ලය |
| B පෙක්ටින් | Q ග්ලූකෝස් |
| C සෙලියුලෝස් | R ෆ්‍රක්ටෝස් |
| D කයිටින් | S ග්ලූකොසැමීන් |

පොලිසැකරයිඩය සහ එහි තැනුම් ඒකකය නිවැරදිව ගලපා ඇති සංකලනය තෝරන්න

1) AR, BQ, CS, DP
2) AP, BR, CQ, DS
3) AR, BP, CQ, DS
4) AS, BP, CQ, DR
5) AR, BP, CS, DQ

03. ගොල්ගි උපකරණය,

1) පැතලි සහ නාලිකාමය මඩි ජාලයක් එක මත එක පිහිටි ගොනුවකි.
2) ට්‍රාන්ස් මුහුණත මගින් ERහි සිට පැමිණෙන ආශයිකා ලබා ගනී.
3) පටල කර්මාන්තශාලා ලෙස ද හඳුන්වයි.
4) ස්‍රාවී සෛලවල බහුලව දක්නට ලැබේ.
5) ස්වයංජීර්ණය හේතුවෙන් සෛල මිය යාමට හේතු වේ.

04 ශාක සෛලයක ඌනන විභාජන අවධීන් සහ සිදුවීම් කිහිපයක් පහත දක්වේ.

a) ප්‍රාක් කලාව I - න්‍යෂ්ටි ආවරණය බිඳ වැටීම.
b) ප්‍රාක් කලාව II - කේන්ද්‍රදේහය මගින් තර්කු උපකරණ නිපදවීම.
c) යෝග කලාව II - ප්‍රවේණිකව සර්වසම වර්ණදේහ යෝග කලා තලය මත පෙළ ගැසීම.
d) වියෝග කලාව I - සහෝදර වර්ණදේහාංශ ප්‍රතිවිරුද්ධ ධ්‍රැව දෙසට චලනය වීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ/ය වන්නේ

1) a පමණි 2) c පමණි 3) b හා d පමණි 4) a හා c පමණි 5) a, b හා d පමණි



CamScanner

05 ප්‍රභා පද්ධති පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න
1) ආලෝකය එල ලබා ගන්නා සංකීර්ණයේ ක්ලෝරොෆිල් a හා ක්ලෝරොෆිල් b වර්ණක පමණක් දක්නට ලැබේ.
2) ප්‍රභාපද්ධති II හි ඇති ප්‍රාථමික ඉලෙක්ට්‍රෝන ප්‍රතිග්‍රාහකයා රේඛීය සහ චක්‍රීය ඉලෙක්ට්‍රෝන ගැලීමට සම්බන්ධ වේ
3) ප්‍රභාපද්ධති II හි ඇති ක්ලෝරොෆිල් a අණුව P–700 ලෙස හැඳින්වේ.
4) ප්‍රභා පද්ධතියේ ඇති විශේෂිත ක්ලෝරොෆිල් a අණු, ෆෝටෝන අවශෝෂණය කර ඔක්සිහරණයට ලක්වේ.
5) ජලය විච්ඡේදනය කිරීමේදී නිදහස් වන ඉලෙක්ට්‍රෝන යොදා ගැනෙන්නේ උද්දීපනය වන ප්‍රභාපද්ධති II හි ක්ලෝරොෆිල් උදාසීන කිරීම සඳහා ය

06 ප්‍රභාසංශ්ලේෂණය සහ සෛලීය ශ්වසනය යන ක්‍රියාවලි දෙකටම පොදු සංයෝගයක් වන්නේ
1) $FADH_2$
2) NADPH
3) 3-PGA
4) පයිරුවේට්
5) ඇසිටැල්ඩිහයිඩ්

07. ජෛව විවිධත්වයේ පරිණාමයට අදාළ සිද්ධීන් කිහිපයක් සහ ඒවාට අදාළ කාල වකවානු නිවැරදිව දක්වා ඇත්තේ,
1) අවුරුදු බිලියන 3.5 කට පෙර - පළමු ප්‍රභාසංශ්ලේෂක ජීවියා සම්භවය
2) අවුරුදු මිලියන 700 කට පෙර - ස්පොන්ජීන් පරිණාමය
3) අවුරුදු මිලියන 500 කට පෙර - ආත්‍රෝපෝඩා පූර්වජයන් බිහිවීම
4) අවුරුදු මිලියන 380 කට පෙර - දිලීර භෞමික ගණවාසීකරණය
5) අවුරුදු බිලියන 1.2 කට පෙර - ප්‍රථම සුන්‍යෂ්ටික ජීවියා බිහිවීම

08. බීජ රහිත සනාල ශාක පරිණාමය පිළිබඳව දී ඇති පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) ආදි පොසිල සාක්ෂිවලට අනුව, සනාල ශාකවල පූර්වජයන් හට එකම තරමේ ජන්මාණු ශාක සහ බීජාණු ශාක තිබී ඇත.
2) එකම ශාකය මඟින් පුං හා ජායා ජන්මාණු නිපදවීම විෂමබීජාණුකතාවය නම් වේ
3) මෙම ශාකවල ශෛලම පටකයේ ඇති ශෛලම වාහිනී ඒකක, ඉතා කාර්යක්ෂමව ජලය හා ඛණිජ පරිවහනය සිදු කරයි
4) ගදාපාසි සියල්ල විෂමබීජාණුක වන අතර ශූකි පාසි සියල්ල සමබීජාණුක වේ.
5) පොසිල ලෙස සංරක්ෂණය වී ඇති ආදි සනාල ශාක මුල්වල හා කඳන්වල පටක සැකැස්ම සමාන වේ

09. ප්‍රෝටිස්ටා රාජධානියේ ජීවීන්ගේ දැකිය හැකි සෛල භිත්ති සහ ප්‍රභාසංශ්ලේෂී වර්ණක පහත දක්වා ඇත

| ජීවියා | සෛල භිත්ති සංඝටකය | ප්‍රභාසංශ්ලේෂී වර්ණකය |
|---|---|---|
| A – *Gelidium*<br>B - ඩයටම<br>C - *Sargassum* | P ඇල්ජිනික් අම්ලය<br>Q සෙලියුලෝස්<br>R පෙක්ටින් | X ක්ලෝරොෆිල් a, c, කැරොටින් සැන්තොෆිල්<br>Y ක්ලෝරොෆිල් a, c, සැන්තොෆිල්<br>Z ක්ලෝරොෆිල් a, d, ෆයිකොබිලි ප්‍රෝටීන් |

ඉහත සංකලන අතරින් නිවැරදි සංකලනය වන්නේ,

1) AQX, BRY, CPZ
2) AQZ, BRX, CPY
3) APY, BQX, CRZ
4) ARZ, BQY, CPY
5) AQZ, BPY, CRX

10. නිඩාරියා වංශයේ ජීවීන්ගේ දැකිය හැකි ලක්ෂණ වන්නේ
1) ප්‍රාක්වෘක්කිකා, ආමාශවාහිනී කුහරය
2) දංශක සෛල, මධ්‍යශ්ලේෂය
3) සංවේදී පිටිකා, ද්විප්‍රස්තර
4) පැපුල, මධ්‍යශ්ලේෂය
5) ප්‍රාවරය, ග්‍රාහිකා

11. *Allomyces* පිළිබඳ නිවැරදි වනුයේ,
1) අස්ක බීජාණු
2) ද්විනෘෂ්ටික දිලීර ජාලය
3) චල බීජාණු
4) බහිර්ජනන අලිංගික බීජාණු
5) සාවාර සූත්‍රිකා

12. කෝඩේටා වංශයට අයත් ජීවීන්ගේ ලක්ෂණ පහත දී ඇත. එම සම්බන්ධතා අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1) බලයා - රළු කොරල
2) වවුලා - ජම්බාලිය
3) කටුස්සා - වාත කුටීර සහිත අස්ථි
4) රාජාලියා - වර්ණ දෘෂ්ටිය
5) ගවයා - ග්‍රන්ථි රහිත සම



CS CamScanner

13. පහත සඳහන් ජීවීන් අතුරෙන් $CO_2$ භාවිත කර කාබොහයිඩ්‍රේට සංශ්ලේෂණය කළ නොහැකි ජීවියා / ජීවීන් වන්නේ

a. *Cuscuta* b. *Nirtobacter* c. *Nostoc*

d. දම් සල්ෆර් නොවන බැක්ටීරියා e. *Drosera*

1) a පමණි 2) b හා d පමණි 3) a හා d පමණි

4) c හා e පමණි 5) a, b හා d පමණි

14. ශාක තුළ ඇපොප්ලාස්ට මාර්ගය ඔස්සේ ජලය ගමන් කිරීම සිදුවන්නේ,

1) පහසු කළ විසරණය හා තොග ප්‍රවාහය 2) ආසෘතිය හා විසරණය 3) ආසෘතිය හා තොග ප්‍රවාහය

4) විසරණය හා තොග ප්‍රවාහය 5) ආසෘතිය හා පහසු කළ විසරණය

15 වක්‍රතා කෝණය 160° ක් වූ හබරල පත්‍ර වෘන්ත තීරු එක බැගින් X හා Y සුක්‍රෝස් ද්‍රාවණ දෙකක ගිල්වා සමතුලිත වීමට තබන ලදි. පැයකට පසු X ද්‍රාවණයේ තිබූ පත්‍ර වෘන්ත තීරුවල වක්‍රතාව වැඩි වී ඇති අතර, Y ද්‍රාවණයේ තිබූ පත්‍ර වෘන්ත තීරුවල වක්‍රතාව අඩු වී ඇති බව නිරීක්ෂණය විය

මෙම නිරීක්ෂණ අනුව නිවැරදි ප්‍රකාශනය විය හැක්කේ,

1) X ද්‍රාවණය, පටකයට සාපේක්ෂව උපරි අභිසාරක ද්‍රාවණයකි
2) Y ද්‍රාවණයේ තිබූ පටකයේ අන්තරාසෘතිය සිදුවී ඇත
3) X ද්‍රාවණයේ ගිල් වූ පටකයෙන් ජලය පිටවී ඇත
4) පටකයේ ජල විභවය, Y ද්‍රාවණයේ ජල විභවයට වඩා ඉහළ අගයකි
5) X ද්‍රාවණයේ ජල විභවය, Y ද්‍රාවණයේ ජල විභවයට වඩා අඩුය

16. *Selaginella* සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) ක්ෂුද්‍රබීජාණු පත්‍රවල/පාදයේ පැත්තේ ක්ෂුද්‍රබීජාණුධානි පැදේ
2) මහාබීජාණුධානිය තුළ මහාබීජාණු විශාල සංඛ්‍යාවක් සෑදේ
3) පුං හා ජායා ජන්මාණු ශාක ස්වයංපෝෂිය
4) ක්ෂුද්‍රබීජාණු බිත්තිය මගින් පුං ජන්මාණු ශාකය ආරක්ෂාවී ඇත
5) පුං හා ජායා ජන්මාණු ශාක මහේක්ෂීය වේ

17. ආලෝකය මගින් ශාකවල ක්‍රියාරම්භ වන සිදුවීම් කිහිපයක් පහත දක්වේ

a බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය වැඩි කිරීම b බීජාධරණ දික්වීම නිෂේධනය

c අතු බෙදීම උත්තේජනය d වියනට පහළින් ඇති ශාක උසින් වර්ධනය

e බීජ ප්‍රරෝහණය නිෂේධනය

දූර රක්ත කිරණ හේතුවෙන් ක්‍රියාරම්භ වන සිදුවීම් ඇතුළත් වරණය වනුයේ,

1) a හා c පමණි 2) b හා d පමණි 3) a හා d පමණි

4) d හා e පමණි 5) c හා e පමණි

18. පත්‍ර වෘද්ධතාව වේගවත් කරන, බීජ ප්‍රරෝහණය උත්තේජනය කරන, සනාල පටක විභේදනය දිරි ගන්වන ශාක වර්ධක ද්‍රව්‍ය පිළිවෙලින් අඩංගු වරණය වන්නේ,

1) ඇබ්සිසික් අම්ලය, සයිටොකයිනින්, ගිබරලින්
2) එතිලීන්, ගිබරලින්, ඔක්සින්
3) ඇබ්සිසික් අම්ලය, ඔක්සින්, සයිටොකයිනින්
4) ඇබ්සිසික් අම්ලය, සයිටොකයිනින්, එතිලීන්
5) සයිටොකයිනින්, ගිබරලින්, ඔක්සින්

19 මානව හෘත් පේශි හා කංකාල පේශිවලට පොදු ලක්ෂණයක් වන්නේ,

1) සෛල විලේඛ සහිත වීම 2) අන්තරස්ථාපිත මඩල පිහිටීම

3) බහුන්‍යෂ්ටික වීම 4) අනිච්ඡානුග ක්‍රියාකාරීත්වය

5) කෙටි සෛල කලාපයින් සමන්විත වීම



CamScanner

20 මානව කුඩා අන්ත්‍රයේ සිදුවන ආහාර ජීර්ණය සම්බන්ධ නිවැරදි සංකලනය වනුයේ.

| | උපස්තරය | ජීරණ එන්සයිමය | ජීරණ ඵලය |
|---|---|---|---|
| 1. | පොලිසැකයිඩ | ආන්ත්‍රික ඇමයිලේස් | ඩයිසැකරයිඩ |
| 2. | කුඩා පොලිපෙප්ටයිඩ | අග්න්‍යාශයික කාබොක්සිපෙප්ටිඩේස් | පෙප්ටයිඩ |
| 3. | කුඩා පෙප්ටයිඩ | ආන්ත්‍රික ප්‍රෝටියේස | ඇමයිනෝ අම්ල |
| 4 | මේදය | අග්න්‍යාශයික ලයිපේස් | මොනොග්ලිසරයිඩ |
| 5. | කුඩා පොලිපෙප්ටයිඩ | ට්‍රිප්සින් | කුඩා පෙප්ටයිඩ |

21. පහත සඳහන් ඌනතා ලක්ෂණ ඇතිවන්නේ කවර විටමින ඌන වීමෙන් ද?
ප්‍රතිශක්තිය දුර්වල වීම, හිරිවැටීම, පෙලග්‍රා, රුධිර කැටි ගැසීම දුබලවීම
1) ෆෝලික් අම්ලය, රෙටිනෝල්, කොබල් ඇමීන්, විටමින් K
2) තයමීන්, කොබල් ඇමීන්, විටමින් K, විටමින් E
3) රෙටිනෝල, ෆෝලික් අම්ලය, රයිබොෆ්ලෙවින්, කොබල් ඇමීන්
4) රෙටිනෝල්, කොබල් ඇමින්, නියසින්, විටමින් K
5) කොබල් ඇමින්, විටමින් E, විටමින් D, විටමින් K

22. හෘදයක් රහිත, ක්ෂීණ වූ සංවෘත සංසරණ පද්ධතියක් අඩංගු ජීවීන් ඇතුළත් වරණය වනුයේ,
1) ගැඩවිලා, කුඩැල්ලා
2) ගොළුබෙල්ලා, දැල්ලා
3) ඉස්සා, අක්මා පතැල්ලා
4) මුහුදු තාරකාව, මුහුදු කාසි
5) හැකරැල්ලා, කිරි පණුවා

23. පුද්ගලයකුගේ රුධිරයේ ඇති ප්‍රතිදේහ ජනක, ප්‍රතිදේහ හා ඔහුට පාරවිලයනය කළ හැකි ප්‍රතිග්‍රාහකයාගේ රුධිර ගණය පිළිබඳ නිවැරදි සංකලනය තෝරන්න.

| | ප්‍රතිදේහ ජනකය | ප්‍රතිදේහ | ප්‍රතිග්‍රාහක රුධිර ගණය |
|---|---|---|---|
| 1 | $A^+$ | ප්‍රති – B | $O^+$, $A^+$, $A^-$ |
| 2 | $B^+$ | ප්‍රති – A | $B^-$, $B^+$, $AB^+$ |
| 3 | $A^-$ | ප්‍රති – B | $AB^-$, $A^-$, $AB^+$ |
| 4 | $O^+$ | ප්‍රති A, ප්‍රති B නැත | $O^+$, $O^-$, $AB^+$ |
| 5 | $B^-$ | ප්‍රති - B | $B^-$ , $B^+$ |

24 P,Q,R,S,T සත්ත්ව විශේෂවල පරිණත සතුන්ගේ සාමාන්‍ය දේහ පරිමාව හා සාමාන්‍ය දේහ පෘෂ්ඨ වර්ගඵලය පහත වගු දක්වේ.

| විශේෂය | P | Q | R | S | T |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය දේහ පරිමාව ($m^3$) | 11 | 12 | 9 | 10 | 8 |
| සාමාන්‍ය දේහ පෘෂ්ඨ වර්ගඵලය ($m^2$) | 27 | 25 | 16 | 21 | 23 |

ශ්වසන වායු හුවමාරුව සඳහා දේහ පෘෂ්ඨය භාවිත කිරීමට වඩාත්ම ඉඩ ඇත්තේ මින් කවර ජීවී විශේෂය විය හැකි ද?
1) P 2) Q 3) R 4) S 5) T

25. ආශ්වාස-ප්‍රශ්වාස ක්‍රියාවලියේ සමස්ථිතික යාමනය පිළිබඳ නිවැරදි වගන්තිය වනුයේ
1) ශ්වසන ක්‍රියාවලිය ඉච්ඡානුග හා අනිච්ඡානුග යන්ත්‍රණයකින් යාමනය වේ
2) ශ්වසන පාලක මධ්‍යස්ථාන වෙත $O_2$ මගින් බලපෑමක් නැත
3) ශ්වසන ක්‍රියාවලියේ පාලන මධ්‍යස්ථාන යුගල් දෙකක් සුෂුම්නා ශීර්ෂකයේ පිහිටයි
4) රුධිරයේ $CO_2$ සාන්ද්‍රණය ඉහළ ගිය විට, එය ජලය සමඟ ප්‍රතික්‍රියා කර $H_2CO_3$ සාදයි
5) මහා ධමනියේ පිහිටි සංවේදක මගින් රුධිරයේ ඉහළ $CO_2$ සාන්ද්‍රණය හඳුනා ගනී



CamScanner

32 TtYyrr x ttYYRr මුහුමෙන් ලද ප්‍රජනිතය පිළිබඳ පහත වගන්ති අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ.
1) එකිනෙකට වෙනස් පුක්තාණු ආකාර 8 ක් ලැබේ.
2) ලක්ෂණ තුනම සඳහා ප්‍රමුඛ පිවින්ගේ සම්භාවිතාව 1/4 කි.
3) සියලුම ලක්ෂණ සඳහා ප්‍රමුඛ සමයුග්මකයින් ප්‍රතිඵල නොවේ
4) ප්‍රජනිතයේ කිසිදු පිවියෙකු ත්‍රිත්ව නිලීන නොවේ
5) ප්‍රමුඛ ලක්ෂණ දෙකක් සහිත රූපානුදර්ශ ලැබීමේ සම්භාවිතාව 3/4 කි.

33. නියුක්ලියෝටයිඩ ප්‍රුගලක ආදේශය පිළිබඳ වගන්ති කිහිපයක් පහත දී ඇත
a) එමගින් අපගතාර්ථක විකෘතියක් ප්‍රතිඵල වේ
b) එමගින් කෘත්‍ය රහිත ප්‍රෝටීනයක් ප්‍රතිඵල විය හැක
c) එය රාමු විස්ථාපිත විකෘතියකි
d) වැඩි ක්‍රියාකාරිත්වයක් සහිත ප්‍රෝටීනයක් ලැබිය හැකිය
e) එමගින් අනර්ථදායී ප්‍රෝටීනයක් කිසි විටෙකත් ප්‍රතිඵල නොවේ

ඉහත ප්‍රතිචාර අතුරෙන් සත්‍ය වනුයේ,

1) a හා b පමණි
2) b හා c පමණි
3) c හා e පමණි
4) a, b හා d පමණි
5) b, c හා e පමණි

34 තර්ජනයට ලක්වූ පිවින්ගේ අවදානම අඩු වන අනුපිළිවෙල සඳහන් වරණය කුමක්ද?
1) බටර්කප්, අලියා, දුම්බර ගල්පර දිය මැඩියා
2) පුංචිලේනා, බටර්කප්, මහමවු
3) මහමවු, වෙසක් ඕකිඩ, පුංචි ලේනා
4) දුම්බර ගල්පර දියමැඩියා, පුංචි ලේනා, අලියා
5) මහමවු, අලියා, මුලත් හපයා

35. සූර්ය UV – B විකරණ වායුගෝලය හරහා විනිවිද යාම වැළැක්වීම සඳහා දායක විය හැකි අන්තර්ජාතික සම්මුතිය වන්නේ,
1) කියොතෝ සම්මුතිය
2) මොන්ට්‍රියෙල් ප්‍රඥප්තිය
3) කාටිජිනා ගිවිසුම
4) මාපොල් සම්මුතිය
5) බාසල් සම්මුතිය

36. ෆයිටොප්ලාස්මාවන් මයිකොප්ලාස්මාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේද?
a) පත්‍ර කීඩැවන් මගින් සම්ප්‍රේෂණය වීම
b) ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂීය වීම
c) ශාක ආසාදනය කිරීම
d) වෛකල්පිත නිර්වායු පිවින් වීම
e) ද්විඛණ්ඩනයෙන් ප්‍රජනනය කිරීම

ඉහත ප්‍රතිචාර අතුරෙන් සත්‍ය වනුයේ.

1) a හා b පමණි
2) a හා c පමණි
3) a, c හා d පමණි
4) b, d හා e පමණි
5) a, c හා e පමණි

37 ක්ෂුද්‍රජීවී ක්‍රියාවලි මගින් නිපදවන වාණිජමය ඵල හා අදාළ ක්ෂුද්‍ර ජීවීන් පහත දක්වා ඇත

| වාණිජමය ඵල | ක්ෂුද්‍ර ජීවියා |
|---|---|
| A චීස් | P. *Rhizopus* |
| B විටමින් $B_{12}$ | Q. *Gluconobacter* |
| C සිට්‍රික් අම්ලය | R. *Pencillium* |
| D ඇසිටික් අම්ලය | S. *Pseudomonas* |
| E ලයිපේස් | T. *Aspergillus niger* |

වාණිජමය ඵල හා ක්ෂුද්‍රජීවියා දැක්වෙන නිවැරදි සංකලනය වන්නේ

1) AS, BQ, CR, DT, EP
2) AR, BS, CT, DQ, EP
3) AP, BR, CS, DQ, ET
4) AT, BQ, CP, DR, ES
5) AR, BQ, CT, DS, EP



CamScanner

38. ක්ෂුද්‍රජීවීන් මිනිසාට ඇති කරන රෝග සහ ඊට අදාළ ක්ෂුද්‍රජීවීන් පහත දැක්වේ

| රෝගය | ක්ෂුද්‍රජීවියා |
|---|---|
| a) උණසන්නිපාතය | *Streptococcus pyogenes* |
| b) බැක්ටීරියා මෙනින්ජයිටිස් | *Haemophilus influenzae* |
| c) අක්ෂි පටල ප්‍රදාහය | *Haemophilus influenzae* |
| d) පැපොල | Verticella- zoster |
| e) ලිංගික හර්පිස් | Herpesvirus |

රෝගය හා අදාළ ක්ෂුද්‍රජීවියා නිවැරදිව ගලපා ඇති වරණය වන්නේ

1) a හා e පමණි 2) b හා c පමණි 3) b, c හා d පමණි
4) c, d හා e පමණි 5) a, d හා e පමණි

39 ජලාලයක් පවත්වාගෙන යාමේදී සති දෙකකට වරක් මෙන්ම මාසිකව සිදු කළ යුතු කාර්යයක් වන්නේ
1) ශාකවල මැරුණු කොටස් ඉවත් කිරීම
2) ආලෝක ප්‍රභවයේ අන්ත පරීක්ෂාකර පවිත්‍ර කිරීම
3) කාබනික අපද්‍රව්‍ය චූෂණය මගින් ඉවත් කිරීම
4) ඇල්ගී පුරා ඉවත් කිරීම
5) දුර්වල ලෙස වර්ධනය වන ශාක ප්‍රතිස්ථාපනය

40 කෝම මගින් ප්‍රචාරණය කළ හැකි ශාකයක් වන්නේ
1) *Gladiolus* 2) *Chlorophytum* 3) *Cynodon* 4) *Mentha* 5) *Hibiscus*

➢ 41-50 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාරවලින් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් නිවැරදිවේ. කවර ප්‍රතිචාර/ය නිවැරදිද යන්න පළමුව විනිශ්චය කරන්න

A, B, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ ........................ 1
A, C, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ ........................ 2
A හා B යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ ........................ 3
C හා D යන ප්‍රතිචාර පමණක් නිවැරදි වේ ........................ 4
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් නිවැරදි වේ ........................ 5

| උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A, B, D නිවැරදිය | A, C, D නිවැරදිය | A, B නිවැරදිය | C, D නිවැරදිය | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් ප්‍රතිචාර නිවැරදිය |

41 පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් සූත්‍රකණිකා සයිටසෝලයේ සිදුවේ ද?
A) ග්ලූකෝස් ⟶ පයිරුවේට්
B) ඔක්සැලෝ ඇසිටේට් ⟶ සිට්‍රේට්
C) පයිරුවේට් ⟶ එතනෝල්
D) මැලේට් ⟶ පයිරුවේට්
E) පයිරුවේට් ⟶ ඇසිටයිල් Co –A

42 ශාක පටක සම්බන්ධ නිවැරදි වගන්ති/ය වනුයේ
A) විභාජක පටකවල සියලුම සෛල සජීවී ය
B) චර්මීය පටක පද්ධතිය තදින් ඇසිරුණු තනි සෛල ස්ථරයකි
C) සෛලම පටකයේ සියලු සෛල ලිග්නීභවනය වී ඇත
D) මෘදුස්තර හා ස්ථූලකෝණාස්තර පටක ශාක කඳ, පත්‍ර හා මුල්වල පවතී
E) අන්තරස්ථ විභාජක සියලු ඒක බීජපත්‍රී ශාකවල ඇත

43 ආත්‍රොපෝඩා වංශයේ සාමාජිකයන්ගේ හමුවන ශ්වසන ව්‍යුහ/ අවයව වන්නේ

A) ජලක්ලෝම B) පත්‍රපෙනහැලි C) දේහ පෘෂ්ඨය

D) ශ්වාසනාල පද්ධති E) පෙනහැලි

44 මිනිසාගේ පෙනහැලි වාතනය පිළිබඳ නිවැරදි වන්නේ

A) ගමය ධන පීඩනයක් යටතේ සිදුවේ

B) ආශ්වාසයේ දී අන්තර් පර්ශුක හා මහාප්‍රාචීර පේශි ඉහිල් වේ

C) ආශ්වාසය සක්‍රිය ක්‍රියාවලියකි

D) මහා ප්‍රාචීර පේශි සංකෝචනයේ ප්‍රතිඵලයක් ලෙස උරස් කුහරයේ පරිමාව වැඩි වේ

E) ආශ්වාසයේදී ගර්ත තුළ පීඩනයට වඩා වායුගෝලීය පීඩනය අඩුය

45 මානව සංවේදක ප්‍රතිග්‍රාහක පිළිබඳ නිවැරදි ප්‍රකාශ/ය තෝරන්න

A) සියුම් ස්පර්ශය - මර්කල් මඬල

B) ධ්වනි කම්පන - කෝර්ටි අවයවයේ සුවිශේෂ රෝම සෛල

C) සිසිලස - රෆිනි දේහාණු

D) ගුරුත්වය - කණේ අලින්ද නාලයේ රෝම සෛල

E) ආලෝක සංවේදී - කේතු

46 මානව කපාලයේ කෝටරක සහිත අස්ථි වනුයේ

A) කීලාස්ථිය B) තලාස්ථිය C) ඡිද්‍රාස්ථිය

D) ලලාටාස්ථිය E) ඌර්ධ්වහනුක අස්ථිය

47 බහුගුණකතාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශ/ය වනුයේ

A) ශාකවල බහුගුණකතාව නිසා ගිගාස් ආචරණය ප්‍රතිඵල වේ

B) බහුගුණකතාවයේ දී සෑම න්‍යෂ්ටියකම සමස්ත සමජාත වර්ණදේහ කට්ටල යුගලකට වඩා පවතී

C) බහුගුණකතාවයේදී ප්‍රවේණික තුල්‍යතාව නැතිවී ඇත

D) විශේෂ දෙකක් අතර මුහුම්ක දී ජාන සම්ප්‍රේෂණයට පාලමක් ලෙස බහුගුණකයන් භාවිතා කළ හැක

E) බහුගුණකතාව නිසා විෂමයුග්මකතාව අඩු වේ

48 ජීවී සෛලවල DNA/ජාන පිළිබඳ පහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ

A) වර්ණදේහයක විශිෂ්ට ස්ථානයක් මත වූ DNA ඛණ්ඩයකින් ජානයක් සෑදී ඇත

B) සමජාත වර්ණදේහ යුගලක සමාන ජාන අඩංගු වේ

C) පූර්වන්‍යෂ්ටික සෛලවල DNA ප්‍රතිවලිතය අඛණ්ඩව සිදු වේ

D) ජානයක අවසන් නිෂ්පාදිතය ලෙස t-RNA ප්‍රතිඵල විය හැක

E) සුන්‍යෂ්ටික DNAවල ජාන අතර ඇති කෘත්‍ය රහිත DNA ඛණ්ඩ ඉන්ට්‍රෝන නම් වේ

49 ඕසෝන් ස්ථරය ක්ෂය වීමට දායක වන සාධක වනුයේ

A) HFC B) PFC C) HCFC

D) CFC E) $HF_6$

50 අඩපණ කරන ලද සජීවී එන්නත් මගින් ප්‍රතිශක්තිකරණය ලබා දෙන රෝග වනුයේ

A) පැපොල B) කම්මුල්ගාය C) කොලරාව

D) පෝලියෝ E) ජලභීතිකාව

AL API ( PAPERS GROUP )



CamScanner

AL API

PAPERS GROUP

CamScanner